# කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය
## AIIB (ඇබෑර්තු නිවේදනය)

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය**

# ඇබෑර්තු - කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය - AIIB

ශ්‍රී ලංකා රජය විසින්, දළ වශයෙන් නිවාස ඒකක 4,074 ක් පමණ ඉදිකිරීම සහ නාගරික සංවර්ධන කලාපය තුළ ප්‍රමුඛතම ආයෝජනයක් වන නාගරික පුනර්ජීවන වැඩසටහන යටතේ කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරීම සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙන් (AIIB) ඇමරිකානු ඩොලර් මිලියන 158 ක මූල්‍ය පහසුකමක් ලබාගෙන ඇත.

මෙම ව්‍යාපෘතිය ප්‍රවාහන, මහා මාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන අතර, නාගරික සංවර්ධන අධිකාරිය (UDA) මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

"කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය වීමේ ව්‍යාපෘතිය" යටතේ පවතින පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් සහ පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| ව්‍යාපෘති වටිනාකම- ඇමරිකානු ඩොලර් මිලියන 25ට වැඩි සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 200 ට අඩු | | | |
|---|---|---|---|
| **අනු අංකය** | **තනතුර** | **ඇබෑර්තු ගණන** | MSD **චක්‍රලේඛ 01/2026 ප්‍රකාරව වැටුප් කාණ්ඩය** |
| 1 | ව්‍යාපෘති අධ්‍යක්ෂ | 1 | A |
| 2 | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | 1 | D |
| 3 | ඉංජිනේරු (සිවිල්) | 2 | D |
| 4 | සැලසුම් සහකාර | 1 | F |
| 5 | තාක්ෂණ නිලධාරී | 1 | F |
| 6 | සහකාර සමාජ විද්‍යාඥ | 1 | F |
| 7 | පරිගණක ක්‍රියාකරු | 1 | සහායක කාර්ය මණ්ඩලය |
| 8 | කාර්යාල සහකාර | 1 | සහායක කාර්ය මණ්ඩලය |

වැටුප් කාණ්ඩයන්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2026 පරිදි වේ.

**නියමයන් සහ කොන්දේසි**

- වේතන, නියමයන් සහ කොන්දේසි, 2026.02.02 දිනැති අංක 01/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට සහ කලින් කලට සිදු කරනු ලබන එහි සංශෝධනයන්ට අනුකූලව වේ.
- මෙම පත්වීම වසරක කාල සීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සිදු කෙරෙන අතර, සතුටුදායක සේවා කාර්ය සාධනය මත පදනම්ව ව්‍යාපෘති කාලසීමාව දක්වා දීර්ඝ කළ හැකිය.
- විදේශ අරමුදල් ලබන ව්‍යාපෘති සහ උසින් වැඩි මහල් ගොඩනැගිලි ව්‍යාපෘති හි පළපුරුද්ද අමතර වාසියක් වේ.

**අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

- විස්තරාත්මක නිවේදනය සහ නිර්දේශිත අයදුම්පත් ආකෘතිය ලබා ගැනීම සඳහා **www.transport.gov.lk** වෙබ් අඩවිය පරිශීලනය කරන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.
- යථා පරිදි සම්පූර්ණ කරන ලද, අයදුම්පත්, ජීවදත්ත පත්‍රිකාව (CV) අදාළ සහතික පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) සම්බන්ධතා විස්තර සමග ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් 2026 මාර්තු 01 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

**අතිරේක ලේකම් (ව්‍යාපෘති),**
**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය,**
**06 වන මහල, සෙත්සිරිපාය - අදියර II, බත්තරමුල්ල.**

**වැදගත්**

- අයදුම්කරනු ලබන තනතුර, කවරයෙහි ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.
- රාජ්‍ය අංශයේ අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා ලබනු නොලැබේ.
- අසම්පූර්ණ හෝ අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- කෙටිලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**ලේකම්,**
**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.**